৺

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,493 - 2026 ජුනි මස 12 සිකුරාදා - 2026.06.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 150 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 155 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 03 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජුනි මස 19 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම

**කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද (වාණිජ) මහාධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී,
(පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් හා පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් පෙර හඳුන්වන ලද)
අංක 450, ගාලු පාර,
කොළඹ 03.

*............පැමිණිලිකරු.*

නඩු අංකය : CHC/078/2022 MR
ස්වභාවය : උකස්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : ඇ. ඩොලර් 1,741,447/56 ශ්‍රී ලංකා මුදලින් රු. 348,289,512/-
ඇස්කිසි අංකය : 25/2025

*එදිරිව*

1. බොරලැස්ගමුව, පැපිලියාන, කොළඹ පාර, අංක 362 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන දයා ඇපරල් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

2. බොරලැස්ගමුව, පැපිලියාන, කොළඹ පාර, අංක 362 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන දයා ගෲප් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

*...........විත්තිකරුවෝ.*

ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව එකී පැමිණිලිකරුට ඉහත 1 සහ 2 විත්තිකරුවන්ගෙන් සමථ කොන්දේසි කඩ කිරීමේ හේතුව මත පහත දැක්වෙන තීන්දු ප්‍රකාශිත මුදල වන,

(*අ*) වර්ෂ 2021 ක් වූ පෙබරවාරි මස 04 දිනට ඉහත කී ඇමරිකානු ඩොලර් 1,643,000 ක කාලීන ණය පහසුකම මත ඇමරිකානු ඩොලර් 1,650,986/80 ක් සහ වර්ෂ 2021ක් වූ පෙබරවාරි මස 05 දින සිට ඇමරිකානු ඩොලර් 1,643,000/- ක මුදල මත 5% ක වාර්ෂික පොළිය ද,

(*ආ*) වර්ෂ 2021 ක් වූ පබෙරවාරි මස 04 දිනට ඉහත කී ඇමරිකානු ඩොලර් 90,460/76 ක කාලීන ණය පහසුකම මත ඇමරිකානු ඩොලර් 90,460/76 ක මුදල ද ව්‍යවස්ථාපිත අයකිරීම් ද රජයේ බදු සහ අනෙකුත් ගාස්තු ද පැමිණිලිකරුට ගෙවන ලෙස තීන්දු කර ඇත.

එකී මුදල සහ පොලිය අයකර ගැනීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද **ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. වඩුතන්ත්‍රී විසින් ලියා සහතික කරන ලද 2012 නොවැම්බර් 06 දිනැති අංක 31 දරන උකස්කරයේ සහ 2017 ඔක්තෝබර් මස 30 දිනැති අංක 575 දරන ද්විතික උකස්කරයේ උපලේඛනයේ** සහ මෙහි පහත උපලේඛනයේ විස්තරකර ඇති නිශ්චල දේපළ වන කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ, දෙහිවල ගල්කිස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 537, විලවල ග්‍රාම නිලධාරී වසමට අයත් විලෙවල කොට්ඨාස අංක 1 කලුබෝවිල නැගෙනහිර, දුටුගැමුණු වීදියේ පිහිටි වරිපනම් අංක 92 දරන කහටගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු කේ. එෆ්. එස්. ගුණසේකර විසින් වර්ෂ 2005ක් වූ ජුනි මස 23 දින මැන සාදන ලද අංක 533 දරන පිඹුරෙහි දැක්වෙන අංක 01 දරන ඉඩම,

**වර්ෂ 2026ක් වූ ජූලි මස 10 දින පෙරවරු 11.00 ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළේ පිහිටීම.* - හොරණ - කොළඹ මාර්ගයේ කොහුවල හන්දියේ සිට කොළඹ දෙසට දුටුගැමුණු වීදිය ඔස්සේ කිලෝමීටරයක් පමණ ගියවිට දුටුගැමුණු වීදියට මුහුණලා වම් පසින් මෙම දේපළ පිහිටා තිබේ. දේපළ වරිපනම් අංකය 92 වේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්,

(ආ) ගැණුම් මිලෙන් සියයට විසිපහ (25%) ක් ද,

(ආ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය ප්‍රකාර නියෝජ්‍ය පිස්කල්තැනගේ ගාස්තු ද,

(ඇ) විකුණුම් සඳහා වන සියලුම වියදම් මුදලින් ගෙවිය යුතු ය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහ (75%) ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවෙහි බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ, දෙහිවල ගල්කිස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 537 විලවල ග්‍රාම නිලධාරි වසමට අයත්, විලෙවල කොට්ඨාස අංක 1 කලුබෝවිල නැගෙනහිර, දුටුගැමුණු වීදියේ පිහිටි වරිපනම් අංක 92 දරන කහටගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම (බලයලත් මිනින්දෝරු ජී. ආර්. නානායක්කාර විසින් වර්ෂ 1981 ක් වූ ජූලි මස 12 දින මැන සාදන ලද අංක 1029 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක සී 1 සහ බලයලත් මිනින්දෝරු වී. පී. සමරවීර විසින් වර්ෂ 1999 ක් වූ ජූලි මස 21 දින මැන සාදන ලද අංක 3191/1 දරන පිඹුර දැක්වෙන කැබලි අංක බී 1 දරන කොටස් ඒකාබද්ධ කිරීමෙන් සාදන ලද බලයලත් මිනින්දෝරු කේ. එෆ්. එස්. ගුණසේකර විසින් වර්ෂ 2005ක් වූ ජුනි මස 23 දින මැන සාදන ලද අංක 533 දරන පිඹුරෙහි දැක්වෙන කැබලි අංක 01 දරන කැබැල්ල නැමැති උතුරු-නැගෙනහිරට : දුටුගැමුණු වීදිය පාරක් සඳහා වෙන් කළ කොටස සහ පිඹුරු අංක 3191 ප්‍රකාර කැබලි අංක 02 ද, දකුණු නැගෙනහිරට : දුටුගැමුණු වීදියේ වරිපනම් අංක 96 සහ 96ඒ ද, දකුණු බස්නාහිරට : පිඹුරු අංක 3191/1 ප්‍රකාර කැබලි අංක 1 ඒ ද, උතුරු බස්නාහිරට : දුටුගැමුණු වීදියේ වරිපනම් අංක 84 සහ 90 ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් එකයි දශම තුනයි අටක් (රූඩ්. 2, පර්. 1.38) විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක F 277/105 දරන පත්ඉරුවේ ලියාපදිංචිකර ඇත.

ඉහත කී ඉඩමට යාම් ඊම් කිරීම සඳහා පහත සඳහන් ඉඩම හරහා වන මාර්ග අයිතිය ද වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ, දෙහිවල ගල්කිස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 537 විලවල ග්‍රාම නිලධාරි වසමට අයත් විලවල කොට්ඨාස අංක 1 කලුබෝවිල නැගෙනහිර දුටුගැමුණු වීදියේ පිහිටි දුටුගැමුණු වීදියේ වරිපනම් අංක 92 දරන කහටගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම මානක වී පී. සමරවීර විසින් වර්ෂ 1996 ක් වූ ජනවාරි මස 05 දින මැන සාදන ලද අංක 3191 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 02 (අඩි 12ක් පළල පාරක් සඳහා වෙන් කළ කොටස) දරන කොටසට මායිම් -

උතුරට : දුටුගැමුණු වීදිය සහ කැබලි අංක සී2බී2ඒ ද , නැගෙනහිරට : කැබලි අංක සී2බී2ඒ ද සහ දුටුගැමුණු වීදියේ වරිපනම් අංක 96ඒ ද, දකුණට : දුටුගැමුණු වීදියේ වරිපනම් අංක 96ඒ ද සහ බස්නාහිරට : මානක ජී. ආර්. නානායක්කාර සාදන ලද අංක 1041ඒ පිඹුර ප්‍රකාර කැබලි අංක සී1 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම දෙකයි හයක් (පර්. 10.26) විශාල ඉඩම සහ හරහා මාර්ග අයිතිය ද වේ.

මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක F277/104 දරන පත්ඉරුවේ ලියාපදිංචිකර ඇත.

ප්‍රධාන රෙජිස්ට්‍රාර් සහ නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2026 ක් වූ මැයි මස 22 දින දී ය.

06-106

**සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය**

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

නඩු අංකය : HC(Civil) 577/2019/MR
ඇස්කිසි අංකය : 58/2025

*...........පැමිණිලිකරු.*

*එදිරිව*

1. වලවේ දූරගේ රත්නසිරි,
මානන්ගොඩ, බටපොල.

2. වලවේ දූරගේ රන්දිම සුදත් මධුසංක,
මානන්ගොඩ, බටපොල.

*..........විත්තිකරුවන්.*

සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2023 ක් වූ ඔක්තෝබර් මස 23 දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව, පැමිණිල්ලේ ආයාචනයේ ඉල්ලා ඇති පරිදි විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුව වෙත ගෙවිය යුතු රුපියල් හත් ලක්ෂ හතලිස් හය දහස් එකසිය හතලිහයි ශත හතලිස් එකක (රු. 746,140/41) මුදලක් ද එකී මුදල මත 2019.04.11 දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා 28% බැගින් වන පොළිය ද ඉන්පසු තීන්දු ප්‍රකාශයේ දින සිට තීන්දු ප්‍රකාශිත මුදල ගෙවා අවසන් වන තෙක් සමස්ත මුදල මත 28% බැගින් වන වැඩිදුර පොලිය සහ,

පැමිණිල්ලේ දෙවන නඩු නිමිත්ත මත වර්ෂ 2019.04.10 දිනට හිඟ ඇති මුදල රුපියල් මිලියන තිස් අටයි දෙලක්ෂයක (රු. 38,200,000/-) මුදලක් හා පොලිය වශයෙන් රුපියල් දාසය ලක්ෂ හැට තුන් දහස් හයසිය තිස් නවයයි ශත අනූ හතර ක (රු. 1,663,639/94) මුදලක් ද වශයෙන් එකතුව රුපියල් මිලියන තිස් නවයයි අට ලක්ෂ හැට තුන් දහස් හයසිය තිස් නවයයි ශත අනූ හතරක (රු. 39,863,639/94) මුලු මුදලක් ද වර්ෂ 2019.04.11 දින සිට ඉහත කී මුලු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් රුපියල් මිලියන තිස් අටයි දෙලක්ෂයක් (රු. 38,200,000/-) වූ එක හිඟ හිටවා ඇති මුල් මුදල මත පවත්නා අනුපාතිකය අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෑම මසකම අවසාන සතියේ ප්‍රකාශයට පත් කරනු ලබන සෑම මසකට වරක් වැඩ කරන පළමු දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන්නා වූ නැවත මිල කිරීම් (ප්‍රතිශෝධනය) දිනට පෙරාතුව සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයකට (AWPR) ඉහලින් වර්ෂයකට සියයට නවයක් 9% වූ පවත්නා අනුපාතිකය මත ගනනය කරනු ලබන වැඩිදුර පොලිය සහ ව්‍යවස්ථාපිත ගාස්තු විත්තිකරුවන්ගෙන් එක්ව සහ/හෝ වෙන් වෙන්ව පැමිණිලිකරුට අයකර ගැනීමට තීන්දුවක් ලබා දී ඇති හෙයින් ද, ඒ අනුව විත්තිකරුවන්ට එරෙහිව ක්‍රියාවේ යෙදවීම සඳහා මා වෙත නිකුත් කර ඇති අධිකාරි පත්‍රයේ බලය පිට, දැනට තහනමට ගෙන ඇති මෙහි පහත සඳහන් දේපළ,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 08 දින පෙ. ව. 10.00 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ගමන් මග.*- පිටිගල නගරයේ සිට පැලවත්ත පාරෙන් කි. මී. 9ක්, 4 වන කණුව දක්වා පැමිණ වමට ඇති කි. මී. 6ක් තාර දැමූ පාරෙන් ගොස් දකුණට ඇති ප්‍රාදේශීය සභා පාරෙන් කි. මී. 2 ක් පැමිණෙන්න. මෙම දේපළ දකුණු පසට වන්නට පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. සම්පූර්ණ මුදල ගෙවන්නේ නැතිනම් ගැණුම් මිලෙන් 25%,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද,
3. පිස්කල් ගාස්තු/වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු.

ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත මතුගම දිසා අධිකරණයේ ඉහත සඳහන් ඇස්කිසි අංකය යටතේ නඩුවට බැර කළ යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පස්දුන් කෝරළේ (නැගෙනහිර), දකුණු මහ පත්තුවේ, අංක 843, ඉහළ හෙවෙස්ස ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වලල්ලාවිට ප්‍රාදේශීය සභා සීමාව තුළ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ හෙවෙස්ස පිහිටි ඇහැලගෙදරවත්ත (ඉහළගෙදරවත්ත), ඇහැලගෙදරවත්ත පිටකට්ටිය (ඉහළගෙදරවත්ත පිට කට්ටිය), මධුරගෙදරවත්ත (මරුගෙදරවත්ත) සහ මධුරගෙදරවත්ත පිටකට්ටිය (මරුගෙදරවත්ත පිටකට්ටිය) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ඒ. පී. ජයසූරිය විසින් මැන සාදන ලද 2016.04.13 දිනැති අංක 6781 දරන පිඹුරේ ලොට් A දරන අ.ග.පි. 111 දරන පිඹුරේ ලොට් අංක 920 හි ලොට් A, B සහ C හි ලොට් 01 සහ 06 ඒකාබද්ධ කිරීමෙන් සෑදුන ඉඩම් කොටස සඳහා මායිම් උතුරට : ටික්කන්දෙ දොළ, අ.ග.පි. 111 දරන පිඹුරේ ලොට් අංක 792, 883, 884 සහ පිඹුරු අංක 2760 ලොට් 07 (ගම් සභා පාර), අංක 03 සහ 04 අ.ග.පි. 111 අමතර 28 දරන පිඹුරේ ලොට් 4252, 4255 පිඹුරු අංක 2956 දරන ලොට් 1 B, පිඹුරු අංක 2965 හි ලොට් 5ඒ, පිඹුරු අංක 6779 හි ලොට් 5C2 සහ අ.ග.පි. 111 අමතර 28 දරන පිඹුරේ ලොට් 4252 ද, නැගෙනහිරට : පිඹුරු අංක 2760 ලොට් 07 (ගම් සභා පාර), අංක 03 සහ 04, අ.ග.පි. 111 අමතර 28 දරන පිඹුරේ ලොට් 4252, 4255 පිඹුරු අංක 2956 හි ලොට් 1B, පිඹුරු අංක 2965 හි ලොට් 5A, අ.ග.පි. 111 අමතර 28 දරන පිඹුරේ ලොට් 4259, අ.ග.පි. 111 පිඹුරේ ලොට් අංක 918 හි ඉතිරි කොටස සහ හිනිදුම් දොළ ද, දකුණට : පිඹුරු අංක 2760 හි ලොට් 03, පිඹුරු අංක 2956 හි ලොට් 1B අ.ග.පි. 111 හි ලොට් 918 හි ඉතිරි කොටස සහ හිනිදුම දොළ, අ.ග.පි. 111 පිඹුරේ ලොට් අංක 994, 993 සහ 2090 ද සහ බස්නාහිරට : අ.ග.පි. 111 පිඹුරේ ලොට් අංක 994 සහ 2090, ටික්කන්ද දොළ, අ.ග.පි. 111 පිඹුරේ ලොට් අංක 792, පිඹුරු අංක 2760 හි ලොට් 03 සහ අ.ග.පි. 111 පිඹුරේ ලොට් අංක 918 හි ඉතිරි කොටස ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර විසි අටයි, රූඩ් එකයි, පර්චස් විසි එකයි දශම එකයි බිංදුව (අ. 28, රූ. 1, පර්. 21.10) විශාල වූ ඉඩම හා එය තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුළු සෑම සියලු දේත් සමග වේ. මෙය මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 50/76 දරන පත්ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව් ඒ ඩී රාමනායක මාවත,
කොළඹ 02.
දුරකතන : 011 - 2371371

රෙජිස්ට්‍රාර්/නි. පිස්කල්,
දිසා අධිකරණය,
මතුගම.

06 - 182

---

## දිසා අධිකරණය - පොළොන්නරුව

අංක 16694/MB/16 හා 16742/MB/16 දරන නඩුවලට අදාළව පොළොන්නරුව දිසා අධිකරණයේ ඇ/අංක 73/2025 හා 74/2025 යටතේ පිස්කල් මගින් කරනු ලබන

තහනම් කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එගොඩ පත්තුවේ 218 ඉහළ ඇල්ලේවැව ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයේ ඉහළ ඇල්ලෙවැව නැමැති ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් සම්පාදිත ඔහු භාරයේ ඇති අ.ජ.පි.පො. 185 අති. අංක 01දරන පිඹුරේ කැබලි අංක 214 දරණ ප්‍රමාණයෙන් හෙක්ටයාර බින්දුවයි දශම දෙකයි බින්දුවයි බින්දුවක් (හෙක්: 0.200) විශාලත්වයක් ඇති ඉඩමට බලයලත් මිනිදෝරු ඒ. ජී. රේණුකා අයෝනි මහත්මිය විසින් 2010.03.24 වන දින නැවත මැන සකස් කරන ලද අංක 2010/15 දරණ මානක සැලසුමේ කැබලි අංක 01 වශයෙන් හඳුන්වනු ලබන ඉඩමට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | - | එෆ්.ටී.පී. 13 හි කැබලි අංක 460 ද, |
| නැගෙනහිරට | - | එෆ්.සී.පී.පො. 185හි කැබලි අංක 215 ද, |
| දකුණට | - | එෆ්.සී.පී.පො. 185හි කැබලි අංක 25 ද, |
| බස්නාහිරට | - | එෆ්.සී.පී.පො. 185හි කැබලි අංක 213 ද, |

යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් එකයි, පර්චස් තිස් නවයයි දශම එකක් (රූඩ් 01, පර්: 39.1) *හෙවත්* ප්‍රමාණයෙන් හෙක්ටයාර බින්දුවයි දශම දෙකයි බින්දුවයි බිංදුවක් (හෙක්:0.200) ක් විශාල වූ ඉඩම සහ එහි තුළ පිහිටි නිවාස ගොඩනැගිලි සහ ගහකොළ පළතුරු ආදී සැම සියළුදේත් වෙයි.

ඉඩමේ ප්‍රමාණය : අක්කර 00, රූඩ් 01, පර්චස් 39.1

මෙය පොළොන්නරුව ඉඩම් ලියාපිදිංචි කිරීමේ කාර්යාලයේ LDO J 4/3, LDO J 34/84 හා LDO J 152/78 හි ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසීම.-* කදුරුවෙල සිට මඩකලපු පාරේ කි.මී. 12ක් ගියවිට හමුවන මඩකලපු හංදියෙන් දකුණට හැරී මහියංගන පාරේ කි.මී. 18ක් පමණ ගියවිට හමුවන පැලැටියාව හංදියෙන් වමට ඇති ඇල්ලේවැව පාරේ කි.මී. 8ක් පමණ ගියවිට හමුවන ඉහළ ඇල්ලේවැව පාසල හංදියෙන් දකුණට හැරී මීටර් 400ක් පමණ ගියවිට දකුණුපස වෙන්දේසි කිරීමට නියමිත දේපළ පිහිටා ඇත.

නියෝජ්‍ය පිස්කල් විසින්,

2026 ජූලි මස 16 වන දින පෙ.ව 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසානයේ මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් 25% ක් (සියයට විසිපහක්)
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු
3. පිස්කල් කොමිස් මුදල, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය ප්‍රකාරව වන කොමිස් මුදල
4. සියලුම ප්‍රචාරක ගාස්තු
5. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු: 500/-
6. වෙන්දේසිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතීනම් එම ගෙවීම්
7. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු

- අදාළ දේපළ විකිණීම උසාවිය අනුමැතිය මත සිදු වේ.

ගැණුම් මිලෙන් 75% (සියයට හැත්තැපහක්) වූ ඉතිරිය වෙන්දසි දින සිට දින 30 ඇතුළත ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කළයුතු වේ.

ඉහත සඳහන් කළ පරිදි දින 30 ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් මුදලින් තැන්පත් කළ මුදල් ආපසු නොගෙවන අතර දේපළ නැවත වෙන්දේසි කිරීමට ක්‍රියා කරනු ඇත.

අදාළ ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂාව සහ වැඩි විස්තර ප්‍රාදේශීය කළමනාකාරිණී, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, පොළොන්නරුව වෙතින් ලබාගත හැක.

දුරකථන අංක 027-2224404, 027-2225760,
ෆැක්ස් 027-2223522
ඊමේල් - polrho@peoplesbank.lk

රෙජිස්ට්‍රාර්/පිස්කල්,
දිසා අධිකරණය,
පොළොන්නරුව.

06-118

# විවිධ දැන්වීම්

**පාර්ලිමේන්තුව**

ශ්‍රී ලංකා ඒකාබද්ධ වාටඩ් ලේකම්වරුන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ආචාර්ය හර්ෂ ද සිල්වා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 (1) දරන ස්ථාවර නියෝග යටතේ "ශ්‍රී ලංකා ඒකාබද්ධ වාටඩ් ලේකම්වරුන්ගේ ආයතනය" සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ආයතනය සංස්ථාගත කිරීමයි :

1. ශ්‍රී ලංකාවේ හා වෙනත් ප්‍රදේශයක සංස්ථාපති ප්‍රධානීන් (ඒකාබද්ධ ලේකම්වරුන්) ගේ වෘත්තීය නියෝජනය කිරීම.

2. ඒකාබද්ධ ලේකම් ධුරයෙහි ඵලදායි හා සමතුලිත වර්ධනය කළමනාකරණය කටයුතු ප්‍රවර්ධනය කිරීම.

3. ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අනුබද්ධ හෝ උපකාරී වන වෙනත් සේවාවන් සැපයීම හෝ වෙනත් කටයුතු සිදු කිරීම සහ ආයතනයේ එක් හෝ කිහිපයක් අරමුණු සමග පහසුවෙන් හා ප්‍රයෝජනවත් ලෙස එක්ව ක්‍රියාත්මක කළ හැකි වෙනත් කටයුතු සිදු කිරීම.

ආචාර්ය හර්ෂ ද සිල්වා,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

06-136

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.